# ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

SLCARP

## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පහත සඳහන් රැකියා ප්‍රභේදයන් සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - (HM 1-1)

**සුදුසුකම්**

**බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පීඑච්ඩී (Ph.D) උපාධියක් සමග ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස වසර හතරක (04) සතුටුදායක සේවය.

**අභ්‍යන්තර**

විද්‍යාව හෝ කෘෂිකර්ම පිළිබඳ අදාළ විෂය සංයුක්තිය සමග ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පීඑච්ඩී (Ph.D) උපාධියක් සහ SLCARP හි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස වසර හතරක (04) සතුටුදායක සේවය.

**හෝ**

ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ ප්‍රභේදයේ "ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී" තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවය.

සැ. යු. පිළිවෙලින් ඒ ඒ ශික්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රකාශන කර තිබීම අමතර සුදුසුකමක් වේ.

සේවක ප්‍රභේදයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය.

MM1-1-2016 රු. [80,295-5X2,270-රු.114,345]

**වයස :** වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**අයදුම් කළයුතු අන්දම :**

අවශ්‍ය තොරතුරු සහිත අයදුම්පතක් අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වලට හා සේවා පළපුරුද්දට අදාළ සහතික පිටපතක් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2024.01.03 වන දින හෝ ඊට පෙර කොළඹ 07, විජේරාම මාවත, නො. 114/9, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ලේකම්/ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔහු/ ඇය අයදුම්කරන තනතුරට තෝරාගත හොත් ඔහු/ ඇය මුදා හැරිය හැකි බව දන්වමි. අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරණ තනතුරේ නාමය ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන. අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්/ අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,**
**නො. 114/9, විජේරාම මාවත,**
**කොළඹ 07.**